# තනතුරු පුරප්පාඩු
# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

01. ජ්‍යෙෂ්ඨ දත්ත විශ්ලේෂක - (පුරප්පාඩු -01)

අධ්‍යාපනික සුදුසුකම් :

බාහිර

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර

දත්ත විශ්ලේෂක තනතුරෙහි I ශ්‍රේණියේ (කනිෂ්ඨ කළමනාකරණ) තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් ලබා තිබීම.

වයස :

අවුරුදු 30 කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 කට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

වැටුප් සංකේතය හා වැටුප් තලය :

MM 1-1: MSD 2/2016 [Rs. 53,175 - 10x1,375 - 15x1,910 - 95,575/- ]

02. ජ්‍යෙෂ්ඨ ක්‍රම විශ්ලේෂක - (පුරප්පාඩු -01)

<u>අධ්‍යාපනික සුදුසුකම් :</u>

<u>බාහිර</u>

අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර තුනක (03) සේවා පළපුරුද්දක් සහිත පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක්.

අ.පො.ස.(සා/පෙ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

<u>අභ්‍යන්තර</u> :

කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ I ශ්‍රේණියේ ක්‍රම විශ්ලේෂකයෙකු ලෙස අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

<u>වයස :</u>

අවුරුදු 30 කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 කට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

<u>වැටුප් සංකේතය හා වැටුප් තලය</u> :

MM 1-1: MSD 2/2016 [Rs. 53,175 - 10x1, 375 - 15x1, 910 - 95,575/-]

03. පරිගණක තාක්ෂණ සහකාර - (පුරප්පාඩු -01)

<u>අධ්‍යාපනික සුදුසුකම් :</u>

(අ) i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් එක් වතාවක දී විෂයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී "සාමාන්‍ය පොදු පරීක්ෂණය" හැර සියලුම විෂයන්ගෙන් සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම ලබා තිබීම.

<u>වෘත්තීය සුදුසුකම් :</u>

පිළිගත් ආයතනකින් ලබා ගත් පරිගණක මෘදුකාංග / දෘඩාංග පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම. (N.V.Q. 05 ට නො අඩු)

සහ

අදාල ක්ෂේත්‍ර යේ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

<u>වයස</u> :

අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

<u>වැටුප් සංකේතය හා වැටුප් පරිමාණය :</u>

MA 2-2 (රු.30,310 – 10 x 300 – 7 x 350 – 4 x 600 – 20 x 710 – 52,360)

<u>වෙනත් ප්‍රතිලාභ :</u>

අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය දැරිය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා වැටුපෙන් 15% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ 3% ක් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට (ETF) දායකත්වයක් දරනු ඇත.

**ඉහත සඳහන් වැටුප් වලට අමතරව සියලුම තනතුරු සඳහා රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ විශේෂ දීමනා ගෙවනු ලැබේ.**

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය ප්‍රතිලාභ හිමිකම් යෝජනා ක්‍රමයක්ද ක්‍රියාත්මක කෙරේ.

අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතික වල පිටපත් ද ඥාති සම්බන්ධයක් නැති විස්තර සැපයිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 114, විජේරාම මාවත,කොළඹ 07** යන ලිපිනයට **2024 අප්‍රේල් 05** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි **තැපෑලෙන් එවිය යුතුය.** අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළදී ආයතනයේ ලේඛකාධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැකිය. එසේ නැතහොත් ආයතනයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සියලු විස්තර **www.harti.gov.lk** වෙබ් අඩවියෙහි අන්තර්ගතය.

රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් සිය ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**
**හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
**අංක : 114,**
**විජේරාම මාවත,**
**කොළඹ 07.**
**2024.03.22**
**011 - 2696981**